# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 මාර්තු මස 17 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2023.03.22 දින නිකුත් කරන ලදී)**

# දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 15.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

## (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2023 අංක    දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 365 වන වගන්තිය සංශෝධනය කිරීම

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 365 වන සහ 365අ වන වගන්ති පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

අස්වාභාවික වැරදි පිළිබඳව දක්වා ඇති ප්‍රතිපාදන සංශෝධනය කිරීම

(i) ප්‍රධාන ප්‍රඥප්තියේ 365 වන වගන්තිය ඉවත් කර පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරන ලැබේ:–

"යම් සතෙකු සමඟ ස්වභාව ධර්මයට විරුද්ධව කැමැත්තෙන් ම කාමුක සංසර්ගයෙහි යෙදෙන තැනැත්තෙකු, අවුරුදු දහය දක්වා කාලයක ට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු අතර, දඩයකට ද යටත් විය යුතු ය.".

*පැහැදිලි කිරීම:* මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරදට අවශ්‍ය වූ කාමුක සංසර්ගය ඇති කිරීමට ප්‍රවේශ කිරීම ප්‍රමාණවත් වේ.

"තැනැත්තන් අතර දැඩි අශිෂ්ඨ ක්‍රියා" පිළිබඳ දක්වා ඇති ප්‍රතිපාදන ඉවත් කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 365අ වන වගන්තිය ඉවත් කිරීම

(ii) ප්‍රධාන ප්‍රඥප්තියේ 365අ වන වගන්තිය මෙම පනත මගින් ඉවත් කරනු ලැබේ.

තවදුරටත් සැක දුරු කිරීමේ වගන්තිය

(iii) ලිංගික දිශානතිය නෛතික වරදක් ලෙස සලකන ප්‍රතිපාදන සංශෝධනය කිරීම මෙම පනත පැනවීමේ ව්‍යවස්ථාදායකයේ චේතනාව ලෙස සැලකිය යුතු ය.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව